## 2024-06-24 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

**01. පොදුරාජ්‍ය මණ්ඩලීය Blue Charter Project Incubator ආයතනයෙන් ලබා දෙන මූල්‍ය ප්‍රදානයන් මඟින් කඩොලාන සංරක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

2023 වර්ෂයේදී පොදුරාජ්‍ය මණ්ඩලයීය Blue Charter Project Incubator ආයතනය විසින් කඩොලාන සංරක්ෂණය වෙනුවෙන් ප්‍රදානයන් ලබා දීම සඳහා පොදුරාජ්‍ය මණ්ඩලීය රටවලින් ව්‍යාපෘති යෝජනා කැඳවා ඇත. ඒ සඳහා ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති ව්‍යාපෘති යෝජනා 02ක් පොදුරාජ්‍ය මණ්ඩලීය Blue Charter Project Incubator ආයතනය විසින් තෝරාගනු ලැබ තිබේ. ඒ අනුව, ශ්‍රී ලංකාවේ කඩොලානයන්හි මූලික කාබන් නියැදිය ගණනය කිරීමේ ව්‍යාපෘතිය සහ කඩොලාන ප්‍රතිස්ථාපනය කිරීමේදී මුල් සංක්‍රමණිකයන් පිළිබඳව අධ්‍යයනය කිරීම සහ සැටලයිට් හා ඩ්‍රෝන තාක්ෂණය ආධාරයෙන් කඩොලාන සහ මුහුදු තෘණ අතරමැදි කලාපය සිතියම්ගත කිරීමේ ව්‍යාපෘතිය සඳහා ප්‍රදානයන් ලබා දීමට එම ආයතනය විසින් තීරණය කරනු ලැබ ඇත. එකී ව්‍යාපෘතීන් වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කිරීමටත්, ඒ අනුව අදාළ ගිවිසුම්වලට එළඹීම පිණිසත් වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**02. 2024-2026 කාලය සඳහා ශ්‍රී ලංකාව සහ වියට්නාමය අතර අධ්‍යාපනික සහයෝගීතාව පිළිබඳ ගිවිසුමකට එළඹීම**

ශ්‍රී ලංකාව සහ වියට්නාමය අතර උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ද්විපාර්ශ්වික සහයෝගීතාව තවදුරටත් වර්ධනය කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇති අතර, ඒ සඳහා 2017-2020 දක්වා කාලසීමාව තුළ එළඹ ඇති ගිවිසුම සංශෝධන සහිතව 2024-2026 දක්වා වන කාලසීමාව සඳහා ක්‍රියාත්මක කිරීම පිණිස දෙපාර්ශ්වය විසින් එකඟ වී ඇත. ඒ අනුව, උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධනය සහ නවෝත්පාදන සම්බන්ධ තොරතුරු හා අත්දැකීම් හුවමාරු කර ගැනීම, ඒකාබද්ධ පර්යේෂණ පැවැත්වීම, දෙපාර්ශ්වයේ විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන අතර ද්විපාර්ශ්වික සහයෝගිතා වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම, දෙපාර්ශ්වය විසින් එකඟ වූ

ක්ෂේත්‍රවල ප්‍රථම උපාධි හෝ පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා ශිෂ්‍යත්ව හුවමාරු කර ගැනීම හා දෙරටේ විශ්වවිද්‍යාල/පර්යේෂණ මධ්‍යස්ථාන අතර සිසුන්/විද්වතුන් හුවමාරු කර ගැනීම ආදී අරමුණු සහිතව 2024-2026 දක්වා වන කාලසීමාවට වලංගු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ වියට්නාම සමාජවාදී ජනරජය අතර අධ්‍යාපන සහයෝගීතාව සම්බන්ධයෙන් වන ගිවිසුමට එළඹීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. **හෝමාගම, පිටිපන ප්‍රදේශයේ පිහිටි ඉඩම් කොටසක් ලංකා විදුලිබල මණ්ඩලය වෙත ලබා දීම**

විද්‍යා හා තාක්ෂණ නගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘති සඳහා විදුලිබල අවශ්‍යතාව ඉහළ යාමත් සමඟ එම ප්‍රදේශයේ ග්‍රිඩ් උපපොළක් ඉදි කිරීම සඳහා හෝමාගම, පිටිපන පිහිටි මාහේනවත්ත නැමති ඉඩමෙන් ඉඩම් කොටසක් ලබා දෙන ලෙස ලංකා විදුලිබල මණ්ඩලය විසින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, හඳුනාගනු ලැබ ඇති අක්කර 02 රූඩ් 03 පර්චස් 15.41 ක ඉඩම් කොටස රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ලංකා විදුලිබල මණ්ඩලය වෙත වසර 30ක කාලයක් සඳහා බදු පදනම මත ලබා දීම පිණිස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **ශ්‍රී ලංකා කායික රෝග විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනයට බදු දී ඇති රාජගිරියේ පිහිටි ඉඩම අවුරුදු 50ක කාලසීමාවකට නැවත බදු දීම**

1999-05-13 දින සිට ක්‍රියාත්මක වන පරිදි, නාගරික සංවර්ධන අධිකාරිය සතු රාජගිරියේ වැලිකඩ පිහිටි පර්චස් 30ක ඉඩම් කොටසක් පර්යේෂණ කටයුතු සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීම පිණිස සහනදායී බදු පදනම මත අවුරුදු 30ක කාලසීමාවකට ශ්‍රී ලංකා කායික රෝග විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනයට ලබා දී ඇත. එම ඉඩම තුළ ඉදි කර ඇති ශ්‍රී ලංකා කායික රෝග විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල මේ වන විට අලුත්වැඩියා කළ යුතුව පැවතීමත්, ඒ සඳහා සැලකිය යුතු මූල්‍ය ආයෝජනයක් සිදු කළ යුතු වීමත් යන කරුණු සැලකිල්ලට ගෙන, අදාළ ඉඩම දීර්ඝ කාලසීමාවකට නැවත බදු පදනම මත ලබා දෙන ලෙසට එම ආයතනය විසින් ඉල්ලීමක් ඉදිරිපත් කර තිබේ. ඒ අනුව, රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් තීරණය කරනු ලබන වාර්ෂික බදු කුලියක් අය කර ගැනීමේ පදනම මත වසර 50ක

කාලසීමාවක් සඳහා අදාළ ඉඩම් කොටස ශ්‍රී ලංකා කායික රෝග විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනය වෙත දීර්ඝකාලීන බදු පදනම මත ලබා දීම පිණිස වැඩබලන නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **හිඟුරක්ගොඩ ගුවන්තොටුපොළ සංවර්ධනය කිරීම**

දැනට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කළමනාකාරිත්වය යටතේ මෙහෙයවනු ලබන හිඟුරක්ගොඩ ගුවන්තොටුපොළ ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා ප්‍රමිතීන්ට අනුකූලව සංවර්ධනය කිරීමේ අවශ්‍යතාව හඳුනා ගනු ලැබ ඇත. ඒ අනුව, එම ගුවන්තොටුපොළ සඳහා ප්‍රධාන සැලැස්ම සකස් කිරීම සහ ඊට අදාළ අනෙකුත් කාර්යයන් සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය, සීමාසහිත ගුවන්තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම සහ මාර්ග සංවර්ධන අධිකාරිය යන ආයතනවල නියෝජිතයින්ගෙන් යුත් කමිටුවක් පත් කරනු ලැබ තිබේ. එකී කමිටුවේ නිර්දේශ පරිදි හිඟුරක්ගොඩ ගුවන්තොටුපොළ අංග සම්පූර්ණ ගුවන්තොටුපොළක් වශයෙන් සංවර්ධනය කිරීම පිණිස අවශ්‍ය පියවර ගැනීම සඳහා ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා සහ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **පිරිවෙන් අධ්‍යාපනය සඳහා ඩිජිටල් තාක්ෂණය හඳුන්වා දීම**

පිරිවෙන් අධ්‍යාපනය සඳහා ඩිජිටල් තාක්ෂණය හඳුන්වා දීම මගින් පිරිවෙන් අධ්‍යාපනය සවිබල ගැන්වීම පිණිස වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට තාක්ෂණ අමාත්‍යාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව සැලසුම් කර තිබේ. එමගින්, පිරිවෙන් ආශ්‍රිත ගුරුවරුන්ට හා පැවිදි/ගිහි ශිෂ්‍යයන්ට ශ්‍රී ලාංකික ජාතික බෞද්ධ උරුමය ගවේෂණයට හා විශ්ලේෂණයට ඩිජිටල් තාක්ෂණය උපයෝගී කර ගැනීමට හැකි වනු ඇත. ඒ අනුව, එක් පිරිවෙනක් සඳහා අවම වශයෙන් පරිගණක දෙකක්, ස්මාර්ට් පුවරුවක් සහ මුද්‍රණ යන්ත්‍රයක් ලබා දීමට හැකි වන පරිදි යෝජිත වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිණිස තාක්ෂණ අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා සහ අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **ගන්දර ධීවර වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ කාලසීමාව දීර්ඝ කිරීම සහ මුළු පිරිවැය ඇස්තමේන්තුව සංශෝධනය කිරීම**

ගන්දර ධීවර තොටුපොළ පවතින ස්ථානයේ ධීවර වරායක් ඉදිකිරීම සඳහා 2019-07-07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. මෙම ව්‍යාපෘතිය 2023 දෙසැම්බර් මාසය වන විට අවසන් කිරීමට නියමිතව තිබූ නමුත්, කොවිඩ් - 19 වසංගත තත්ත්වය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් ව්‍යාපෘතියේ ඉදිකිරීම් අපේක්ෂිත පරිදි ඉටු කිරීමට නොහැකි වී තිබේ. ඒ අනුව, ව්‍යාපෘතියට අදාළ ගොඩබිම් ඉදිකිරීම් ද ඇතුළුව සියලු වැඩ නිම කිරීමට හැකි වන පරිදි ව්‍යාපෘතියෙහි කාලසීමාව 2023 දෙසැම්බර් මස සිට 2026 දෙසැම්බර් මස දක්වා දීර්ඝ කිරීමටත්, මිල විචලනයන් මත පදනම්ව මුළු පිරිවැය ඇස්තමේන්තුව සංශෝධනය කිරීමටත් ධීවර අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **ශ්‍රී ලංකා යුනෙස්කෝ හවුල්කාරිත්වයේ 75 වැනි සංවත්සරය**

ශ්‍රී ලංකා - යුනෙස්කෝ හවුල්කාරිත්වය මේ වර්ෂයේදී වර්ෂ 75ක් සම්පූර්ණ කරනු ලබන අතර, ඒ සඳහා වන සංවත්සරය සැමරීම පිණිස ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව, අධ්‍යාපන අමාත්‍යාංශය, අදාළ අනෙකුත් අමාත්‍යාංශ සහ ආයතන එක්ව වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේ. 75 වසරක යුනෙස්කෝ හවුල්කාරීත්වය සහ ජයග්‍රහණ සැමරීම, යුනෙස්කෝව විසින් ශ්‍රී ලංකාවේ ලැයිස්තුගත කර ඇති උරුමයන් පිළිබඳව දේශීය හා ජාත්‍යන්තර ප්‍රජාව දැනුවත් කිරීම මඟින් සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම, දෙපාර්ශ්වය අතර පවතින දැනුම්වත්භාවය තවදුරටත් වැඩිදියුණු කිරීම යන අරමුණු පෙරදැරිව 75 වන සංවත්සර උළෙල 2024-07-16 දින නෙළුම් පොකුණ රඟහලේදී පැවැත්වීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණයේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම**

දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමට අදාළව දැනට ක්‍රියාත්මක වෙමින් පවතින හා ක්‍රියාත්මක කිරීමට යෝජිත නව උප ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙතින් ඉටු කරවා ගැනීම පිණිස 2024-01-08 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී

අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, එම ක්‍රීඩාංගනයේ කණිෂ්ඨ ක්‍රීඩාගාරයෙහි සහ නව මලල ක්‍රීඩාපිටියේ දෙවන නැරඹුම් පීයිකාවෙහි වහලයන් ඉදි කිරීමට සැලසුම් කර තිබේ. එකී ඉදිකිරීම් කාර්යයන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙතින් ඉටු කරවා ගැනීම පිණිස ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **තඹපවනි සුළං විදුලි බලාගාරයේ වගකීම්, මෙහෙයුම් සහ නඩත්තු කොන්ත්‍රාත්තුව අලුත් කිරීම**

ලංකා විදුලිබල මණ්ඩලයට අයත් තඹපවනි සුළං විදුලි බලාගාරයේ පූර්ණ වාණිජ මෙහෙයුම් කටයුතු 2021-05-18 දින ආරම්භ කර තිබේ. වසර තුනක (03) කාලයක් සඳහා එම විදුලි බලාගාරයේ වගකීම්, මෙහෙයුම් සහ නඩත්තු සේවා සපයාගැනීම පිණිස ලංකා විදුලිබල මණ්ඩලය විසින් Vestas Wind Lanka (Pvt) Limited සමඟ කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් තබා ඇති අතර, එකී ගිවිසුමේ කොන්ත්‍රාත් කාලය 2024-05-17 දිනෙන් අවසන් වී ඇත. එබැවින්, එකී කාර්යයන් සඳහා නව සේවා සැපයුම්කරුවෙකු තෝරාගත යුතුව ඇත. ඒ අනුව, තරගකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් සුදුසු සේවා සැපයුම්කරුවෙකු තෝරා ගැනීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **ද්විත්ව ඉන්ධන ධාරිතාව සහිත මෙගාවොට් 200ක අභ්‍යන්තර දහන එන්ජින්වලින් සමන්විත කෙරවලපිටියේ ස්වභාවික වායු බලාගාරය**

ද්විත්ව ඉන්ධන ධාරිතාව සහිත මෙගාවොට් 200ක අභ්‍යන්තර දහන එන්ජින්වලින් සමන්විත කෙරවලපිටියේ ස්වභාවික වායු බලාගාර ව්‍යාපෘතිය, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති 2023-2042 දීර්ඝකාලීන විදුලි ජනන සැලැස්ම මඟින් හඳුනාගෙන ඇති ව්‍යාපෘතියක් වේ. මෙම ව්‍යාපෘතිය සඳහා කෙරවලපිටිය සීමාසහිත සොබාදනව් සමාගමට යාබදව ඇති භූමි ප්‍රදේශය වෙන් කර ඇති අතර ස්වාධීන බලශක්ති නිෂ්පාදකයෙකු ලෙස වසර 20ක් සඳහා වූ ගොඩනැගීම-අයිතිය දැරීම-ක්‍රියාත්මක කිරීම-අයිතිය පැවරීම (BOOT) යන පදනම යටතේ මෙම බලාගාරය සංවර්ධනය කිරීමට අපේක්ෂා කරනු ලැබ තිබේ. ඒ අනුව, අදාළ කාර්යය සඳහා තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් සුදුසු ආයෝජකයෙකු හඳුනා ගැනීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **ඩීසල් (0.05% M.S.) නැව් තොග හතරක් (04) මිල දී ගැනීම වෙනුවෙන් වූ දිගුකාලීන කොන්ත්‍රාත්තුව පිරිනැමීම**

2024-08-01 සිට 2024-12-31 දක්වා කාලය සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව වෙත ඩීසල් (0.05% M.S.) නැව් තොග 04ක් මිල දී ගැනීමේ දිගුකාලීන කොන්ත්‍රාත්තුව සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන් වෙතින් මිල ගණන් කැඳවා ඇත. ඒ අනුව, ලැබී ඇති ලංසු ඇගයීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් ලබා දී ඇති නිර්දේශය මත පදනම්ව, අදාළ කාලය තුළ ඩීසල් බැරල් 280,000+/-5% ක් බැගින් වූ නැව් තොග 04 ක් සපයාගැනීම සඳහා වූ කොන්ත්‍රාත්තුව M/s Zhongxi Energy Development (Ningbo) Co. Ltd., China වෙත පිරිනැමීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. **ශ්‍රී ලංකා පොලිසියේ ඉදිකිරීම් ව්‍යාපෘතිවල ඉතිරි වැඩ නිම කිරීම**

ශ්‍රී ලංකා පොලිසිය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීමේ අරමුණින් ඉදිකිරීම් ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇතත්, 2020 වර්ෂයේදී කොවිඩ් - 19 වසංගත තත්ත්වය ව්‍යාප්ත වීම සහ රට තුළ ඇති වූ ආර්ථික අර්බුදය හේතුවෙන් 2021 - 2023 වසරවලදී වැඩ නිම කිරීමට සැලසුම් කර තිබූ පහත සඳහන් ව්‍යාපෘති අපේක්ෂිත පරිදි අවසන් කිරීමට නොහැකි වී තිබේ:

* කොළඹ 02, කුමාරන් රත්නම් පාරේ පිහිටි කනිෂ්ඨ ශ්‍රේණියේ නිලධාරීන්ගේ විවාහක නිල නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය.

* කටාන ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ නේවාසික ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය.

* කොල්ලුපිටිය පොලිස් ස්ථාන ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීමේ ව්‍යාපෘතිය.

එම ව්‍යාපෘතිවල ඉතිරි වැඩ නිම කිරීමට හැකි වන පරිදි ඒවායේ මුළු පිරිවැය ඇස්තමේන්තු සංශෝධනය කිරීමටත්, ව්‍යාපෘති අවසන් කිරීමේ කාලසීමාව 2024-2027 දක්වා දීර්ඝ කිරීමටත් මහජන ආරක්ෂක අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

14. **2019 අංක 22 දරන ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය පනත සංශෝධනය කිරීම**

2022 වර්ෂයේදී ස්ථාපිත කරන ලද ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය විසින් සමාජීය, විද්‍යා හා තාක්ෂණ, ආරක්ෂක, පාරිසරික සහ සේවා නවෝත්පාදන සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සිදු කරනු ලබයි. වර්තමාන අවශ්‍යතාවන්ට අනුව, 2019 අංක 22 දරන ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය පනත ප්‍රකාරව ආයතනයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා එම පනතට සංශෝධන කිහිපයක් හඳුන්වා දීමේ අවශ්‍යතාව පැන නැගී ඇත. ඒ අනුව, එකී පනත සංශෝධනය කිරීම පිණිස පනත් කෙටුම්පත සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම සඳහා අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

15. **1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත සංශෝධනය කිරීම**

ස්ථාපිත කරන ලද හෝ ක්‍රියාත්මකව පවතින සමථ මණ්ඩල නොතිබීම, සමථ මණ්ඩල විසින් නිකුත් කරනු ලබන නිරවුල් නොකිරීමේ සහතිකය නිකුත් කිරීමේ ප්‍රමාදයන් වැනි පරිපාලනමය ගැටලු සහ දෙපාර්ශ්වයම සමථයකට එළඹීම පිළිනොගන්නා අවස්ථාවන්හිදී අධිකරණය හමුවට පැමිණීම නොවැළැක්වීමේ අවශ්‍යතාව සාක්ෂාත් කර ගැනීම පිණිස 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනතේ 7වන වගන්තිය සංශෝධනය කිරීම සඳහා 2023-09-25 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සංශෝධන පනත් කෙටුම්පත සකස් කර ඇති අතර, ඒ සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමටත් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

***********